# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2306/87 – 2022 නොවැම්බර් මස 19 වැනි සෙනසුරාදා – 2022.11.19

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# I වැනි කොටස: (I) වැනි ඡෙදය – සාමාන්‍ය

## රජයේ නිවේදන

මගේ අංකය: IR/COM/02/2021/154.

**ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන පරිච්ඡේදය(1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරාවුල් පනතේ 4(1) වන වගන්තිය යටතේ නියෝගය**

මෙම නියෝගය අනුබද්ධිත කම්කරු කොමසාරිස් ජනරාල්වරයාගේ ප්‍රකාශනයේ නියම කර දක්වා ඇති කාරණය පිළිබඳව,

*එක් පාර්ශ්වයක් වශයෙන්,*

ආර්. වයි. ජී. එස්. ගයාන් යාපා මයා, ශ්‍රී ලංකා රාජ්‍ය වැවිලි සංස්ථාව, ප්‍රසම්පාදන අංශය, අංක 21, බී.සී.සී. පරිශ්‍රය, මිරානියා වීදිය, කොළඹ 12.

*සහ*

*අනෙක් පාර්ශ්වය වශයෙන්,*

ශ්‍රී ලංකා රාජ්‍ය වැවිලි සංස්ථාව, අංක 21, බී.සී.සී. පරිශ්‍රය, මිරානියා වීදිය, කොළඹ 12.

අතර කාර්මික ආරාවුලක් පවතින හෙයින් ද,

කම්කරු හා විදේශ රැකියා අමාත්‍ය මනූෂ නානායක්කාර වන මම 1957 අංක 14 හා 1957 අංක 62 හා 1962 අංක 4 හා 1968 අංක 39 (1968 අංක 37 දරන කාර්මික ආරාවුල් ( විශේෂ ප්‍රතිපාදන) පනත සමග කියවා) දරන පනත්වලින් සංශෝධිත වූ ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන පරිච්ඡේදය (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරාවුල් පනතේ 4(1) වන වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල අනුව, එකී ආරාවුල බේරුම් කිරීමෙන් නිරවුල් කිරීම සඳහා බේරුම්කරු වශයෙන්, ගාල්ල, අනගාරික ධර්මපාල මාවත, අංක 32/26එල්, එම්. එම්. අයි. ආර්. ඒ. ජයතිලක මයා පත් කර ඔහු වෙත මෙයින් යොමු කරනු ලැබේ.

මනූෂ නානායක්කාර,
කම්කරු හා විදේශ රැකියා අමාත්‍ය.

2022 නොවැම්බර් මස 14 වැනි දින,
කොළඹ දීය.



*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

මගේ අංකය: IR/COM/02/2021/154.

**ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 අධිකාරය වන කාර්මික ආරාවුල් පනත**
**( 1956 ප්‍රතිශෝධිත මුද්‍රණය)**

*එක් පාර්ශ්වයක් වශයෙන්,*

ආර්. වයි. ජී. එස්. ගයාන් යාපා මයා, ශ්‍රී ලංකා රාජ්‍ය වැවිලි සංස්ථාව, ප්‍රසම්පාදන අංශය, අංක 21, බී.සී.සී. පරිශ්‍රය, මිරානියා වීදිය, කොළඹ 12.

*සහ*

*අනෙක් පාර්ශ්වය වශයෙන්,*

ශ්‍රී ලංකා රාජ්‍ය වැවිලි සංස්ථාව, අංක 21, බී.සී.සී. පරිශ්‍රය, මිරානියා වීදිය, කොළඹ 12.

ඉහත සඳහන් පාර්ශවයන් අතර ඇති **කාර්මික ආරාවුලට හේතු වී පවත්නා කරුණු වනුයේ –**

“ශ්‍රී ලංකා රාජ්‍ය වැවිලි සංස්ථාවේ සේවය කරන ආර්. වයි. ජී. එස්. ගයාන් යාපා මහතාට කළමනාකරණ සේවා චක්‍රලේඛ 02/2016 හි සඳහන් වැටුප් පියවර හිමි ද? හිමි නම් එය ලබා නොදීමෙන් අසාධාරණයක් සිදුව තිබේ ද? යන්නත් එසේ අසාධාරණයක් සිදුව තිබේ නම් හිමිවිය යුතු සහනයන් කවරේ ද? කවරදා සිටද? යන්නත් පිළිබඳව වේ.”

**බී. කේ. ප්‍රභාත් චන්ද්‍රකීර්ති,**
කම්කරු කොමසාරිස් ජනරාල්.

2022 ඔක්තෝබර් මස 31 වැනි දින,
කොළඹ කම්කරු කොමසාරිස් ජනරාල් තැනගේ කාර්යාලයේ දී දින යොදන ලදී.

EOG 11 - 0225

---

මගේ අංකය: IR/COM/02/2020/106.

**ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන පරිච්ඡේදය (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරාවුල් පනතේ**

4(1) වන වගන්තිය යටතේ නියෝගය

මෙම නියෝගය අනුබද්ධිත කම්කරු කොමසාරිස් ජනරාල්වරයාගේ ප්‍රකාශනයේ නියම කර දක්වා ඇති කාරණය පිළිබඳව –

*එක් පාර්ශ්වයක් වශයෙන්,*

ආර්. ඉන්දික ප්‍රසාද් මයා, මිනුවන්විලවත්ත, උෟරුමුත්ත, අකුරුස්ස, මාතර.

සහ

*අනෙක් පාර්ශ්වය වශයෙන්,*

ජාතික නිවාස සංවර්ධන අධිකාරිය, 34, ශ්‍රීමත් චිත්තම්පලම් ඒ ගාඩිනර් මාවත, කොළඹ 02.

අතර කාර්මික ආරාවුලක් පවතින හෙයින් ද,

කම්කරු හා විදේශ රැකියා අමාත්‍ය මනූෂ නානායක්කාර වන මම 1957 අංක 14 හා 1957 අංක 62 හා 1962 අංක 04 හා 1968 අංක 39 (1968 අංක 37 දරන කාර්මික ආරාවුල් (විශේෂ ප්‍රතිපාදන) පනත සමග කියවා) දරන පනත්වලින් සංශෝධිත වූ, ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන පරිච්ඡේදය (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරාවුල් පනතේ 4(1) වන වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල අනුව, එකී ආරාවුල බේරුම් කිරීමෙන් නිරවුල් කිරීම සඳහා බේරුම්කරු වශයෙන්, ගොතටුව නව නගරය, කජුගහවත්ත, පෙට්‍රල් ෂෙඩ් ඉදිරිපිට පාර, අංක 16, නීතීඥ විජිතානන්ද මඩවලගම මහතා පත්කර ඔහු වෙත මෙයින් යොමු කරනු ලැබේ.

**මනූෂ නානායක්කාර,**
කම්කරු හා විදේශ රැකියා අමාත්‍ය.

2022 නොවැම්බර් මස 14 වැනි දින,
කොළඹ දී ය.

මගේ අංකය: IR/COM/02/2020/106.

**ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 අධිකාරය වන කාර්මික ආරාවුල් පනත**
**(1956 ප්‍රතිශෝධිත මුද්‍රණය)**

*එක් පාර්ශ්වයක් වශයෙන්,*

ආර්. ඉන්දික ප්‍රසාද් මයා, මිනුවන්විලවත්ත, ඌරුමුත්ත, අකුරැස්ස, මාතර.

සහ

*අනෙක් පාර්ශ්වය වශයෙන්,*

ජාතික නිවාස සංවර්ධන අධිකාරිය, අංක 34, ශ්‍රීමත් චිත්තම්පලම් ඒ ගාඩිනර් මාවත, කොළඹ 02.

ඉහත සඳහන් පාර්ශවයන් අතර ඇති **කාර්මික ආරාවුලට හේතු වී පවත්නා කරුණු** වනුයේ,

“ජාතික නිවාස සංවර්ධන අධිකාරියේ සේවය කරන ආර්. ඉන්දික ප්‍රසාද් මහතාට 2010 බඳවා ගැනීම් පටිපාටියට අනුව MM 1-1 සේවා ශ්‍රේණියට අනුව උසස්වීම් ලබා දීමේ දී අසාධාරණයක් සිදුවී ඇත් ද එසේ අසාධාරණයක් සිදුවී ඇත්නම් ඒ මහතාට ලැබිය යුතු සහනයන් කවරේ ද යන්න පිළිබඳව වේ.”

**බී. කේ. ප්‍රභාත් චන්ද්‍රකීර්ති,**
කම්කරු කොමසාරිස් ජනරාල්.

2022 නොවැම්බර් මස 04 වැනි දින,
කොළඹ, කම්කරු කොමසාරිස් ජනරාල් තැනගේ
කාර්යාලයේ දී දින යොදන ලදී.

EOG 11 – 0226

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.